## 1.24 වියට්නාමයේ ජල රූකඩ කලාව (Water Puppetry) හා බෞද්ධ බලපෑම

චන්ද්‍රසිරි පල්ලියගුරු
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

### ABSTRACT

රූකඩ කලාවට ඇත්තේ ඉපැරණි ඉතිහාසයකි. ජන විනෝදාස්වාදය හා සදාචාරාත්මක කරුණු ජනයාට පැහැදිලි කිරීම සඳහා ආගමික හෝ ලෞකික වශයෙන් වැදගත් වන දිනයන්හි දී සිද්ධස්ථාන හෝ වෙනත් වැදගත් ස්ථානවල දී මෙම රූකඩ නටවන ලද්දේ ය.

වියට්නාමයේ පවත්නා ජල රූකඩ නැටවීමේ කලාව එම රටටම සුවිශේෂ වූවකි. මෙවැනි රූකඩ නැටවීමක් ලෝකයේ වෙනත් කිසිම රටක දක්නට නොලැබේ. මෙම රූකඩ නැටවීම ඉදිරිපත් කරනු ලබන්නේ ඉණ තෙක් ජලයේ බැස ගත් රූකඩ නටවන්නන් විසිනි. ජලය වේදිකාව කොට ගත් මෙම රූකඩ නටවනු ලබන්නේ සමාන්තර ආකාරයට ලීයට සවිකරන ලද ලී පතුරු හා සම්බන්ධ ක්‍රියාකාරිත්ව මගිනි.

වියට්නාමයේ උතුරෙහි රතු ගංගා ඩෙල්ටාවේ වෙසන ගොවියන්ගේ කලාවක් ලෙස හැඳින්වෙන මෙහි ආරම්භකයා ලෙස පුරාවෘත්තවල සඳහන් වන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකි. එකොළොස්වන සියවසේ දී ද මෙම නාට්‍ය සම්ප්‍රදාය වියට්නාමයේ ජනප්‍රියව පැවති බවට ඇති අභිලේඛනමය සාක්ෂ්‍ය නිසා ඉන් පෙර යුගවල ද මෙම රූකඩ නැටවීමේ සම්ප්‍රදාය එම දේශයෙහි ප්‍රචලිතව පැවති බව සිතිය හැකි වෙයි.